# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

★ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල හෝඩියේ ඇතුළත්
(අ) අන්තඃස්ථ
(ආ)වර්ගාන්ත අනුනාසික්‍ය අක්ෂරය බැගින් ලියන්න.

ii. පහත සඳහන් පද විසන්ධි කොට සන්ධි වර්ගය නම් කරන්න.
(අ) පිළිතුරු (ආ) කම්මල

iii. පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක් සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
අපගේ දේශීය බුද්ධියට හා දෘෂ්ඨියට නොගැළපෙන වැඩ පිළිවෙලක් ජනතාව මත බලහත්කාරයෙන් පටවනු ලැබ ඇත.

iv. පහත සඳහන් යෙදුම්වල පළමු වචනය හෝ දෙවන වචනය ගැළපෙන ආකාරයට සකස් කර ලියන්න.
(අ) සොබාධර්මය (ආ) ශුභ පැතුම්

v. පහත සඳහන් පද්‍ය ඛණ්ඩයෙහි ඇතුළත් කෘදන්ත පද දෙකක් ලියන්න.
"විදෙන ලෙළෙන නරුබර පුළුලුකුලැ රැඳී - හෙළන නගන අත නුවනග බැලුම් දිදී"

vi. පහත දක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) දුලබ (ආ) ස්වාධීන

vii. පහත සඳහන් පදවල අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
(අ) ඇසුපිරූ තැන් අඩු මඳ දැනුමක් ඇත්තා
(ආ) අන්‍යයන් අනුගමනය කරමින් කටයුතු කරන්නා

viii. පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) සත්පුරුෂයෝ පිනට දහමට සිත් යොදත්.
(ආ) දඩයම්කරුවා සාවා ද මුවා ද මරයි.

ix. පහත දක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද දෙක තෝරා වෙන වෙන ම ලියන්න.
(අ) එම චාරිත්‍ර වාරිත්‍ර අතර ලෙඩ දුක් පීඩාදියෙන් තමා සුරකින ලෙස කැලෑ දෙවියන්ට ආයාචනා කරමින් පූජාවක් පවත්වනු ලැබේ.

x. පහත වාක්‍යයෙහි ඇතුළත් සමාස පද දෙකක් උපුටා ලියන්න.
"නිලුපුල් මීගඳ නැහැපුඩු අතරින් ළයට කැවේ"

(ලකුණු 20)

02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අප දැනුමෙන් සුපෝෂිත කොට පරිපූර්ණත්වයට පත් කිරීමට සාහිත්‍ය පොත පතට හැකි ය. එහෙත් නූතන තාක්ෂණ මෙවලම් සමඟ අතරමං වී සිටින වර්තමාන පරම්පරාව ක්‍රමයෙන් සාහිත්‍ය පොත පත පරිශීලනයෙන් ඈත් වනු දක්නට ලැබේ. කොතරම් පතපොත පළවුවත් ඒවා කියවීමට පිරිසක් නැති නම් එය රටක පරිහානියට හේතු වෙයි. දැනුමෙන් හීන මිනිසුන්ගෙන් පිරි රටක අනාගතය කෙබඳු විය හැකි ද?

(ආ) වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් මෙරට ඇති කිරීම පිළිබඳ විවිධ කතාබහ ඇති වේ. රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය ගැන දැන් වැඩි උනන්දුවක් ද ඇති වී තිබේ. පිළිකා, හෘදයාබාධ හා අධිරුධිර පීඩනය වැනි බෝ නොවන රෝග සඳහා වස විස සහිත ආහාර - පාන බලපා ඇතැයි දැන් පිළිගැනේ. මෙකී අභියෝගය අප කෙසේ හෝ ජයගත යුතු ය.

(ඉ) සීමිත සම්පතක් වූ ජලය ජීවයේ පැවැත්මට අත්‍යවශ්‍ය ම සාධකයකි. එහි වටිනාකම අතීත ජනයා හොඳින් දැන සිටි නිසා හොඳ ජල කළමනාකරණ ක්‍රමවේදයක් එදා ක්‍රියාත්මක විය. වර්තමාන ජල සම්පත විශාල වශයෙන් දූෂණයට ලක්වෙමින් පවතී. ජල සම්පත සුරැකීම ජීවයේ පැවැත්ම යහපත් ලෙස පවත්වා ගැනීමට විශාල පිටිවහලකි.

(ඊ) පසුගිය දස අවුරුදු කාලයේ දී ලෝකයේ හා ශ්‍රී ලංකාවේ ස්වභාවික අනතුරු වැඩි වෙමින් පවතී. ඒ අතුරින් කඳු නාය යාම නිසා සිදු වූ ජීවිත හානි හා දේපළ හානි නිමක් නොමැත. මෙයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් ය. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මෙවැනි ආපදාවන්ට මුහුණදීම නිසා සංවර්ධන ඉලක්ක ජයගැනීම දුෂ්කර වී ඇත.

(ලකුණු 25)

03) පහත දැක්වෙන පාඨය කියවා වචන 60 - 70 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව සාරාංශ අග ලියන්න.

කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වර්ධනය කිරීමට සහ නිමැවුම ඉහළ දැමීමට තවදුරටත් අංශ ගණනාවක් කෙරේ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. බිංදු ජල වැස්සුම් සහ ආරක්ෂිත ගෘහ තුළ කෘෂි වගා වැනි වැඩි දියුණු කරන ලද ජල කළමනාකරණ තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සහ දෙමුහුන් බීජ සහ ජානමය වෙනස්කම් කරන ලද බීජ භාවිතය වැනි ඉහළ තාක්ෂණික ක්‍රම යොදා ගන්නා අතරතුර ශ්‍රම බලකායේ කුසලතාවන් වැඩිදියුණු කිරීමට උනන්දු කිරීම තුළින් ඵලදායිතාව ඉහළ නංවා ගත හැකි වේ. වී වගාව හා අනෙකුත් ධාන්‍ය වගාවන්ට ඇති ඉහළ ශ්‍රම දයකත්වය රට තුළ ආන්තික ශ්‍රම ඵලදායිතාව ඉහළ යාමට බාධාවක් ව පවතී. එම නිසා අතිරික්ත ශ්‍රමය අනෙකුත් අංශ කරා හුවමාරු වීමට අවස්ථාවක් සැලසීම තුළින් මානව සම්පත වඩාත් සඵල ලෙස කළමනාකරණය කිරීමට හැකි වන අතර එමඟින් ආන්තික ශ්‍රම ඵලදායීතාව ඉහළ නංවා ගත හැකි වේ.

මෙම අරමුණු සඳහා සාමූහික ගොවිතැන හා පෞද්ගලික අංශයේ ගොවිතැන දිරි ගැන්වීම සඳහා යැපුම් කෘෂිකර්මාන්තයේ සිට වාණිජ කෘෂිකර්මාන්තය වෙත විතැන් වීම පූර්ව අවශ්‍යතාවක් වේ. මේ සඳහා ඉඩම් කඩම් පිළිබඳ නීතිමය තත්ත්වය ලිහිල් කිරීම, ගොවි සංවිධාන සමිතිවල කාර්යභාරය වඩාත් ශක්තිමත් කිරීම සහ යන්ත්‍ර සූත්‍ර භාවිතය වේගයෙන් ව්‍යාප්ත කිරීම යනාදිය වැදගත් වේ. එමෙන් ම ආරක්ෂිත තොග පවත්වා ගෙන යාමේ යාන්ත්‍රණයක් ඇති කිරීම වැනි ප්‍රමාණවත් යටිතල පහසුකම් සහ ඵලදායිතා වර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිවැරදි අලෙවිකරණ ක්‍රමවේදයන් පැවතීම ද අවශ්‍ය වේ.

(ලකුණු 10)

04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඉන්දු - ආර්ය ආදිතමයා වශයෙන් සැලකෙන්නේ වෛදික සංස්කෘත භාෂාවයි. ඍග් වේදය වැනි වේද ග්‍රන්ථ ලියා ඇත්තේ මේ භාෂාවෙනි. ඉන්දියාවෙහි පොදු ජනයා භාවිතා කළ භාෂා ප්‍රාකෘත භාෂා නමින් හැඳින්වේ. මාගධී යනුවෙන් හැඳින්වෙන්නේ මගධ දේශයේ භාවිතා වුණු ප්‍රාකෘත භාෂාවයි. මාගධී ප්‍රාකෘතයට සමීපතම භාෂාව සේ සැලකෙන්නේ පාලි භාෂාවයි.

එකම භාෂා පවුලකට අයත් භාෂා අතර පවතින්නේ මිනිස් පවුලක දෙමාපියන් හා දරුවන් අතර පවතින්නාක් වැනි ඥාති සම්බන්ධතාවයකි. එබැවින් ඊට අයත් සමහර භාෂා මාතෘ භාෂා ලෙසත් සමහර භාෂා දුහිතෘ භාෂා ලෙසත් සැලකේ. සිංහල භාෂාවේ මාතෘ භාෂා වශයෙන් සංස්කෘත භාෂාවත් පාලි භාෂාවත් පිළිගැනෙන්නේ මෙබඳු ඥාති සම්බන්ධතා හේතුවෙනි. කිසියම් භාෂාවක මාතෘ භාෂාව නිර්ණය කරනු පිණිස වාග් විද්‍යාඥයින් උපයෝගී කරගෙන ඇත්තේ තුලනාත්මක විධි ක්‍රමයයි.

i. මෙහි සඳහන් ඉන්දු - ආර්ය පවුලේ අදිතමයා කවුරුන් ද?
ii. ඉන්දියාවේ පොදු ජනයාගේ භාෂාව කුමන නමකින් හැඳින්වේ ද?
iii. ඥාති සබඳතා දක්වන භාෂා ලෙස හැඳින්වෙන්නේ මොනවාද?
iv. සිංහල භාෂාවේ මාතෘ භාෂා මොනවාද?
v. භාෂා කාර්යය සඳහා වාග් විද්‍යාඥයින් උපයෝගී කරගෙන ඇති විධි ක්‍රමය කුමක්ද?

(ලකුණු 10)

05) දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශවාසීන්ගේ ජීවිතවලට මෙන් ම වගා කටයුතුවලට ද වන අලින්ගෙන් බාධා පැමිණෙමින් තිබේ. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත් සාමාන්‍ය මිනිසුන්ගේ එදිනෙද කටයුතුවලටත් මෙමඟින් එල්ල වන්නේ විශාල තර්ජනයකි. මෙම ව්‍යවසනයට මුහුණ පා සිටින කහටගස්දිගිලිය ප්‍රදේශයේ බෝපිටිය ග්‍රාමයේ ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් ධූරය හොබවන දිල්හාර රත්නායක ඔබ යැයි සිතා ගම්වාසීන් එකතු වී මෙම උවදුර මැඩපැවැත්වීම සඳහා සම්මත කරගත් යෝජනා කහටගස්දිගිලිය අඩවි වන නිලධාරී වෙත දන්වමින් ඒවා කඩිනමින් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලීම සහිත රාජකාරී ලිපිය ලියන්න.

නැතහොත්

පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න. (මේ සඳහා වචන 100ක් ප්‍රමාණවත් වේ.)

ඉසුරි කුලතිලක වන ඔබ ගම්පහ මහ වීදියේ අංක 25 දරන ස්ථානයේ "සරසි" නමින් පොත්හලක් විවෘත කිරීමට සැලසුම් කරමින් සිටින්නෙහි ය. එය දිනපතා පෙ.ව. 8.00 සිට ප.ව. 7.00 තෙක් විවෘතව තිබෙන අතර පෝය දිනවල දී වසා තැබේ. විවිධ විෂයන්වලට අයත් පොත්පත් මෙන් ම පාසල් උපකරණ ද මිලට ගැනීමේ අවස්ථාව මෙමඟින් උදා කෙරෙයි. ජනවාරි මාසය තුළ මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10% ක වට්ටමක් ද ලබා දෙනු ලැබේ.

(ලකුණු 15)